අධ්‍යාපන පීඨය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පරීක්ෂණය - 2019

# අධ්‍යාපන පරිපාලනය

කාලය පැය තුනයි

**ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

---

1. i. නිලබල සංවිධානයෙහි ප්‍රධාන ලක්ෂණ පහ නම් කරන්න.

(ලකුණු 5)

ii. එම ලක්ෂණ නිලබල හා වෘත්තීමය වශයෙන් බෙදා දක්වා එසේ වර්ග කිරීමට හේතු සඳහන් කරන්න.

(ලකුණු 5)

iii. පාසල නමැති සංවිධානයේ නිලබල ලක්ෂණවලට වඩා වෘත්තීමය ලක්ෂණ ක්‍රියාත්මක වන බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

2. i. කළමනාකරණ ක්ෂේත්‍රයේ ගෙට්ෂෙල් න්‍යාය (Theory of Getzel) රූප සටහනක් භාවිතයෙන් විස්තර කරන්න.

(ලකුණු 12)

ii. ආයතනයක සාර්ථක කළමනාකරණයක් සඳහා “ආයතනික මානය හා පුද්ගලමානය” මනාව ගළපා ලිය යුතු බව පාසල් පද්ධතියෙන් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 13)

3. i. ගුරු වෘත්තිකභාවයට අදාළ නිර්ණායක පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. හොයිල් (Hoyle) ඉදිරිපත් කළ ගුරුභූමිකා නම් කරන්න. (ලකුණු 8)

iii. ඵලදායී ගුරුවරයෙකු වීම සඳහා විවිධ සංවිධාන විසින් ඉදිරිපත් කළ ගුරු කුසලතාවල වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 7)

4. "සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකට පන්තිකාමර කළමනාකරණය ඉහළ දායකත්වයක් සපයයි"

i. පන්තිකාමර කළමනාකරණය යනු කුමක්දැයි නිර්වචනය කොට පන්තිකාමර කළමනාකරණයේ දී ගුරුවරයෙකු විසින් ඉටුකළ යුතු විවිධ කටයුතු ඇසුරින් ඉහත ප්‍රකාශයේ වලංගුතාව පැහැදිලි කරන්න.

(ලකුණු 15)

ii. සාර්ථක පන්තිකාමර කළමනාකරණයක් සඳහා ගුරුවරයෙකුට භාවිතයට ගත හැකි විවිධ උපක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

5. i. විදුහල්පති නායකත්වය පිළිබඳ නිර්වචනයක් ඇසුරින් විදුහල්පති නායකත්වයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 5)

ii. මින්ට්ස්බර්ග් (Mintzberg) ඉදිරිපත් කළ කළමනාකරණ භාවිත අතර සාර්ථක මානව සම්බන්ධතා පැවැත්වීමට නායකත්ව භූමිකා තුන වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 10)

iii. පාසලට එල්ල වී ඇති විවිධ අභියෝග හා චෝදනාවලට සාර්ථකව මුහුණදීම සඳහා විදුහල්පතිට අවශ්‍ය නායකත්ව කුසලතා උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

6. i. සාර්ව සැලසුම්කරණය හා සූක්ෂම සැලසුම්කරණය යන සංකල්ප නිර්වචනය කර, සූක්ෂම සැලසුම්කරණය ජනප්‍රිය වීමට බලපාන ලද හේතු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ii. පාසල් මට්ටමේ ව්‍යාපෘතියක් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘති චක්‍රයේ විවිධ අදියර වැදගත් වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 13)

7. i. පාසල් කළමනාකරණය සඳහා අධීක්ෂණයෙහි ඇති වැදගත්කම, අධීක්ෂණය පිළිබඳ සුදුසු පිළිගත් නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

ii. අභ්‍යන්තර අධීක්ෂණයෙහි ඵලදායිතාව සඳහා පාසල් කළමනාකරුවන්ට යොදා ගත හැකි අධීක්ෂණ ක්‍රම ශිල්ප දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

iii. ඵලදායී අධීක්ෂකවරයෙකු සතුවිය යුතු ගුණාංග හා කුසලතා ලැයිස්තුගත කරන්න.

(ලකුණු 10)

8. i. එෆ්.ඩබ්. ටේලර් හා හෙන්රි ෆේයෝල් ඉදිරිපත් කළ කළමනාකරණ මූලධර්ම මොනවාදැයි දක්වා එකී මූලධර්ම පාසල් කළමනාකරණයට වැදගත් වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ii. විද්‍යාත්මක කළමනාකරණ චින්තනය විවේචනය වීමට බලපෑ හේතු දක්වා ආයතනයක සාර්ථක පැවැත්මට මානුෂීය සබඳතා වැදගත් වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 13)

9. i. "පාසල් ඵලදායිතාව තීරණය කරන සාධක, ප්‍රදේශයෙන් ප්‍රදේශයට, රටින් රටට වෙනස් විය හැකිය" ඉහත ප්‍රකාශයේ අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. ශිෂ්‍ය පූර්ණ පෞරුෂ වර්ධනය සඳහා ඵලදායී පාසලක කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

iii. ඔබේ පාසලේ අවම මට්ටමක ඇති ඵලදායී පාසල් සාධක පහක් නම් කර ඒවා ඉහළ නැංවීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

අ. වෘත්තීය පෙළඹවීම හා සම්බන්ධ ඩග්ලස් මැක් ග්‍රෙගර්ගේ XY න්‍යාය

ආ. ෆෙඩ්රික් හර්ස්බර්ග්ගේ ද්වි සාධක න්‍යාය

ඉ. පාසල් ප්‍රජා සබඳතාව

ඊ. පාසල් පාදක කළමනාකරණය

(ලකුණු 12½ x 2 = ලකුණු 25)

O○O○O○O○O○O○O○O○O○O